

# USDA

වාර්ෂික වාර්තාව

tUlhe;j mwpf;if

Annual Report

# 2010

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය

# පටුන

පිටුව


| | |
|---|---|
| 1. හැඳින්වීම | 01 |
| 2. දැක්ම | 02 |
| 3. මෙහෙවර | 03 |
| 4. සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය | 04 |
| 5. ප්‍රධාන නිළධාරී මණ්ඩලය | 06 |
| 6. සභාපතිතුමාගේ සමාලෝචනය | 08 |
| 7. ක්‍රියාත්මක වැඩසටහන් - 2010 | 10 |
| 8. මූල්‍ය ප්‍රකාශන | 14 |
| 8.1 ශේෂ පත්‍රය | 14 |
| 8.2 ආදායම් හා වියදම් ගිණුම | 15 |
| 8.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 16 |
| 9. රජයේ විගණකාධිපති වාර්ථාව | 18 |


පටුන



# 01. හැඳින්වීම

හැඳින්වීම

## නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පිහිටුවන ලද්දේ 2008 අංක 36 දරණ නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනත මඟිනි.

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පිහිටුවීමේ මූලික අරමුණ වුයේ නාගරික ජනාවාස සංවර්ධනයට අදාල ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම, තිරසර නාගරික ජනාවාස සංවර්ධනයක් ඇතිවනු පිණිස අඩු පහසුකම් නාගරික ජනාවාසවල වෙසෙන ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීම සහ එම ජනතාවට නාගරික පහසුකම් සඳහා ප්‍රවේශය සලස්වමින් දැනට පවතින නිවාස ඒකක වැඩිදියුණු කිරීම හෝ වඩාත් යහපත් නිවාස පහසුකම් ලබාදිම සඳහා වැඩසටහන් සම්පාදනය කර ක්‍රියාත්මක කිරීම සඳහාත්ය.



# 02. දැක්ම

'' තිරසර නාගරික ජනාවාස තුළ උසස් ජීවන
රටාවක් සහතික කිරීම''



දැක්ම



# 03. මෙහෙවර

මෙහෙවර

'' සාකල්‍ය නාගරික සංවර්ධන සැලැස්මකට

අනුගතව ඌණ පහසුකම් සහිත

නාගරික ජනාවාසවල සහ නාගරික කලාපවල

වැසියන්ගේ නිවාස ගැටළුවට

විසඳුම් ලබාදීම හා ඒ හා සමගාමීව

ඔවුන් සමාජ, ආර්ථික හා

සංස්කෘතික වශයෙන් සවිබල ගැන්වීම ''



## 04. සභාපති ඇතුළු අධ්‍යක්‍ෂ මණ්ඩලය

### 2010.01.01 දින සිට 2010.05.05 දින දක්වා අධ්‍යක්ෂ මණ්ඩලය

| | තනතුර | නම | පත්වූ දිනය |
|---|---|---|---|
| 01 | සභාපති | ප්‍රසන්න ගුණවර්ධන මහතා | 2009-01-15 |
| 02 | අධ්‍යක්‍ෂ ජනරාල් (අධ්‍යක්‍ෂ මණ්ඩල ලේකම්) | ජී.පී.කේ. ගාමිණී මහතා | 2009-02-02 |
| 03 | අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජික | භාරත ලක්‍ෂ්මන් ප්‍රේමචන්ද්‍ර මහතා | 2009-02-18 |
| 04 | අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජික | දිසා වීරපාන මහතා | 2009-02-18 |
| 05 | අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජික | විද්‍යාජෝති ඩබ්.එන්. ගැමුණු සිල්වා මහතා | 2009-02-18 |
| 06 | අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජික | එම්. ඉසෙඩ් මොහොමඩ් රිසා මහතා | 2009-02-18 |
| 07 | අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජික | භද්‍රානි ජයවර්ධන මිය | 2009-02-18 |
| 08 | අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජික | එච්.පී.සී. හේරත් මහතා | 2009-02-18 |
| 09 | අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජික | එස්.එස්. මුදලිගේ මහතා | 2009-02-18 |
| 10 | අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජික | ප්‍රසන්න සිල්වා මහතා | 2009-02-18 |
| 11 | අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජික | ඩී.ඩබ්. දයානන්ද මහතා | 2009-02-18 |



## සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය

සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය

### 2010.05.24 සිට 2010.12.31 දක්වා අධ්‍යක්ෂ මණ්ඩලය

| | තනතුර | නම | පත්වූ දිනය |
|---|---|---|---|
| 01 | සභාපති | නීතිඥ පාලිත ගමගේ මහතා | 2010.05.24 |
| 02 | අධ්‍යක්ෂ ජනරාල් (අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්) | වෛද්‍ය සුමිත් වන්නිආරච්චි මහතා | 2010.05.26 |
| 03 | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | පූජ්‍ය ඉත්තෑකන්දේ සද්ධාතිස්ස හිමි | 2010.05.24 |
| 04 | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | වෛද්‍ය නිහාල් ජයතිලක මහතා | 2010.06.15 |
| 05 | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | ජානක කුරුකුලසූරිය මහතා | 2010.06.15 |
| 06 | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | ඒ.ඩබ්.දයානන්ද මහතා | 2010.07.07 |
| 07 | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | එම්.අයි.වී.අමරසේකර මෙනවිය | 2010.07.28 |
| 08 | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | බර්නාඩ් කාරියවසම් මහතා | 2010.05.24 |
| 09 | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | රනිල් ප්‍රියන්ත ප්‍රනාන්දු මහතා | 2010.05.24 |
| 10 | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා | 2010.05.24 |
| 11 | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | අජිත් කිත්සිරි බණ්ඩාර මහතා | 2010.05.24 |
| 12 | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | චමින්ද කුමාර සුදසිංහ මහතා | 2010.05.24 |



## 05. ප්‍රධාන නිලධාරී මණ්ඩලය

ප්‍රධාන නිලධාරී මණ්ඩලය

### 2010.01.01 සිට 2010.05.05 දක්වා ප්‍රධාන නිලධාරී මණ්ඩලය

| | තනතුර | නම | පත්වූ දිනය |
|---|---|---|---|
| 01 | අධ්‍යක්ෂ ජනරාල් | ජී.ජී.කේ. ගාමිණී මහතා | 2009.02.02 |
| 02 | අධ්‍යක්ෂ (ව්‍යාපෘති කළමනාකරණ හා සංවර්ධන) | වයි.ආර්. ද සිල්වා මහතා | 2009.08.01 |
| 03 | ගණකාධිකාරී | එස්. සුමන්තිරන් මහතා | 2009.05.07 |
| 04 | ප්‍රධාන අභ්‍යන්තර විගණක | එන්.ජී.පී. ඩයස් මහතා | 2009.10.01 |
| 05 | ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු | ජී. ජේ.ගුණසේකර මහතා | 2009.10.01 |
| 06 | නීති නිලධාරිනී | ඩී. ඒ. දේවිකා දිසානායක මහත්මිය | 2009.11.01 |
| 07 | ජ්‍යෙෂ්ඨ ව්‍යාපෘති නිලධාරිනී | පී.එස්.ගමගේ මෙනවිය | 2009.01.26 |



# 05. ප්‍රධාන නිලධාරී මණ්ඩලය

## 2010.05.06 සිට 2010.12.31 දක්වා ප්‍රධාන නිලධාරී මණ්ඩලය

| | තනතුර | නම | පත්වූ දිනය |
|---|---|---|---|
| 01 | අධ්‍යක්ෂ ජනරාල් | වෛද්‍ය සුමිත් වන්නිආරච්චි මහතා | 2010.05.26 |
| 02 | අධ්‍යක්ෂ (ව්‍යාපෘති කළමනාකරණ හා සංවර්ධන) | වයි.ආර්. ද සිල්වා මහතා | 2009.08.01 |
| 03 | ගණකාධිකාරී | එස්. සුමන්තිරන් මහතා | 2009.05.07 |
| 04 | ප්‍රධාන අභ්‍යන්තර විගණක | එන්.ජී.පී. ඩයස් මහතා | 2009.10.01 |
| 05 | ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු | ජී. ජේ.ගුණසේකර මහතා | 2009.10.01 |
| 06 | නීති නිලධාරිනී | ඩී. ඒ. දේවිකා දිසානායක මහත්මිය | 2009.11.01 |
| 07 | ජ්‍යෙෂ්ඨ ව්‍යාපෘති නිලධාරිනී | පී.එස්.ගමගේ මෙනවිය | 2009.01.26 |



## 06. සභාපතිතුමාගේ සමාලෝචනය

සභාපතිතුමාගේ සමාලෝචනය

2008 අංක 36 දරණ නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනත මඟින් ස්ථාපිත කරනු ලැබූ මෙම අධිකාරියේ ක්‍රියාත්මක දෙවන වර්ෂය 2010 වර්ෂයයි. මෙම වර්ෂය ආරම්භවන විටත් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය සඳහා කාර්ය මණ්ඩලයක් අනුමත වී නොතිබුණු අතර වර්ෂ 2010.12.30 වන දින වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශ මත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 81 දෙනෙකුගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් අනුමත කරන ලදී.

2010 වර්ෂයේ මැයි මස සිට නව සභාපතිවරයෙකු සහ නව අධ්‍යක්ෂ මණ්ඩලයක් පත්කිරීම සිදුවූ අතර නව අධ්‍යක්ෂ මණ්ඩලය 2010 වර්ෂයේ ජුනි මස සිට වැඩ අරඹන ලදී. නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනතේ ප්‍රකාරව නාගරික සංවර්ධන අධිකාරිය විසින් එකතුකොට නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය වෙත ප්‍රේෂණය කළ අඩු වියදම් නිවාස වැඩසටහන්වලට මුදල් සැපයීම සඳහා දේපල සංවර්ධනය කරන්නන්ගෙන් අයකරන ලද 1% ක සේවා ගාස්තුව 2010 අප්‍රේල් මස සිට නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය වෙත ප්‍රේෂණය නොකරන ලද අතර ඒ අනුව අධිකාරියේ ප්‍රධාන මූල්‍ය ප්‍රභවය අධිකාරියට අහිමි විය.

කෙසේ නමුත් මෙම තත්ත්වය පිළිබඳව මුදල් අමාත්‍යාංශය සමඟ සාකච්ඡාකොට පුනරාවර්තන සහ සංවර්ධන වැඩසටහන් සඳහා ප්‍රතිපාදන ලබාගත හැකි විය. ඒ අනුව අතරමඟ නතර වී තිබූ නාගරික දිළිඳු නිවාස අරුණෝදය කුසුම් නිවාස වැඩසටහන, පැල්පතින් තොර නගර වැඩසටහන අවිච්ඡේද වැඩසටහන් ලෙස නිම කිරීමට මේ වර්ෂයේදී හැකි වූ අතර මේ යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභී නිවාස 664 ක් ද කොළඹ දිස්ත්‍රික්කයෙන් පිටත නිවාස 334 ක් ද මොරටුව අයිවන් වත්ත, නුවරඑළිය බඹරකැලේ, බදුල්ල බදුලුපිටිය හා කයිලගොඩ පැල්පතින් තොර නගර වැඩසටහන යටතේ ආරම්භ කර තිබූ නිවාස 109 ක්ද වැඩ අවසන් කිරීමට හැකි විය.

නව ව්‍යාපෘති යටතේ නිවාස 60 කින් සමන්විත බොරැල්ල, බේස්ලයින් මාවත සිංහපුර II අදියර මහල් නිවාස ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කිරීමද මොරටුව නාගරික කලාපයේ මුහුදු ඛාදනයට ලක්වන වෙරළ තීරයේ පැල්පත්වාසී ප්‍රජාව සඳහා මහල් නිවාස ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා හඳුනා ගැනීමද මෙම වර්ෂයේදී සිදුවිය.

නගමු පුරවර වැඩසටහන යටතේ බොරැල්ල සහස්පුර නිවාස සංකීර්ණය, බොරැල්ල සිංහපුර I අදියර නිවාස සංකීර්ණය, ඔරුගොඩවත්ත වදුළුසෙවණ නිවාස සංකීර්ණය යන නිවාස සංකීර්ණ 03 හි ප්‍රතිසංස්කරණ කටයුතු සමහරක් සිදුකිරීමට හැකි විය.

නාගරික ජනාවාස වැසියන්ගේ ජීවන තත්ත්වය උසස් කරලීම සහ ආකල්ප වෙනසක් ඇති කිරීමේ අරමුණින් ඔවුන් සමඟ ආරම්භ කෙරෙන සමාජ සජීවීකරණ වැඩසටහනක මූලික වැඩ කටයුතු 2010 ලෝක ජනාවාස දිනය මුල්කරගෙන ආරම්භ කිරීමට හැකි විය.



එසේම ප්‍රථමවරට නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ මූලික අරමුණු මත පදනම් වූ සංයුක්ත සැලැස්මක් සකස් කිරීමටද මේ වර්ෂයේ හැකි විය.

අධිකාරියේ අරමුණු සාක්ෂාත්කර ගැනීම සඳහා අධිකාරියේ සේවක මණ්ඩලය පුහුණුකර ගැනීමද අධිකාරිය සඳහා අරමුදලක් ගොඩනගා ගැනීමද කඩිනමින් කළ යුතු කාර්යයක් වන බව සිහිපත් කරමින්, ආරම්භක දෙවන වසර තුළ පවතින සම්පත් ප්‍රමාණය මත ඉටුකරන කාර්ය භාරය හා ඉදිරි වැඩ කටයුතු සඳහා වූ පෙර සූදානම පිළිබඳව සභාපතිවරයා වශයෙන් සතුටු වෙමි.

**නීතිඥ පාලිත ගමගේ**<br>
සභාපති<br>
නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය



## 07. ක්‍රියාත්මක වැඩසටහන් - 2010

2010 වර්ෂයේදී නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් පහත සඳහන් සංවර්ධන වැඩසටහන් 06ක් ක්‍රියාත්මක කර ඇත.

1. ''නාගරික දිළිදු නිවාස අරුණෝදය කුසුම්'' නිවාස වැඩසටහන - අවිච්ඡේද
2. ''පැල්පතින් තොර නගර'' වැඩසටහන - අවිච්ඡේද
3. යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන - අවිච්ඡේද
4. නාගරික මහල් නිවාස වැඩසටහන
5. ''නගමු පුරවර'' වැඩසටහන
6. 2010 ලෝක ජනාවාස දින වැඩසටහන

### 1. නාගරික දිළිඳු නිවාස අරුණෝදය කුසුම් නිවාස වැඩසටහන - අවිච්ඡේද

නාගරික මෙන්ම අර්ධ නාගරික ප්‍රදේශවල ජීවත් වන නිවසක් සාදා ගැනීමට වත්කමක් නොමැති දිළිඳු ප්‍රජාව ඉලක්ක කර ගනිමින් ක්‍රියාත්මක කරන ලද ප්‍රජා සහභාගීත්ව නිවාස සංවර්ධන වැඩසටහනකි.



මෙම වැඩසටහන ප්‍රජාමුල සංවිධානවල සහාය ඇතිව ක්‍රියාත්මක වු අතර ප්‍රතිලාභීන් හඳුනා ගැනීම, නිවාස සැලසුම් කිරීම සහ ඉදිකිරීම් ප්‍රජා සහභාගීත්වයෙන් සිදුකර ඇත. එක් නිවසක් සඳහා රු.125,000.00 ක මූල්‍ය ප්‍රදානයක් එක් ප්‍රතිලාභියෙක් සඳහා ලබාදෙන ලදී. ඉදිකිරීම් සඳහා ප්‍රජා ශ්‍රම දායකත්වය පූර්ණ වශයෙන් ලබා ගැනීම සිදුවිය.

ඒ අනුව 2009 වර්ෂයේ ක්‍රියාත්මක වු එම වැඩසටහන 2010 වර්ෂයේ අතරමඟ නතර විය. ඊට හේතුව වූයේ 2010 වර්ෂයේ අප්‍රේල් මස අමාත්‍යාංශ විෂය පථයන් වෙනස්වීමත් සමඟම නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය යටතට පත්වීමත් සමඟ නාගරික සංවර්ධන අධිකාරිය මඟින් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය වෙත ප්‍රේෂණය කළ අඩු වියදම් නිවාස වැඩසටහන්වලට මුදල් සැපයීම සඳහා දේපල සංවර්ධනය කරන්නන්ගෙන් අයකරන ලද 1% ක සේවා ගාස්තු ලැබීම් අප්‍රේල් මස සිට අධිකාරියට ප්‍රේෂණය කිරීම නතර විය.

ඒ අනුව එකී සේවා ගාස්තු යොදා ගනිමින් එවකට ක්‍රියාත්මක වෙමින් තිබූ සංවර්ධන වැඩසටහන් නතර විය. නමුත් පසුව ගරු ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගේ මැදිහත්වීම මත ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මඟින් ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය හරහා අවිච්ඡේද වැඩසටහන් ලෙස මෙම නිවාස ඉදිකිරීම් නිමකිරීම සඳහා අප ආයතනය වෙත රු.මි. 86.794 ක මුදල් ප්‍රතිපාදන නිදහස් කරන ලදී.



## කොළඹ දිස්ත්‍රික්කය - අවිච්ඡේද

■ කොළඹ දිස්ත්‍රික්කයේ පළාත් පාලන බල ප්‍රදේශ 13 ක නිවාස 664 ක ඉදිකිරීම් නිම කිරීම. **(මුළු වියදම - රු. මි. 56.238)**

| | පළාත් පාලන බල ප්‍රදේශය | ඉදිකිරීම් නිම කල ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|
| 1. | හෝමාගම ප්‍රාදේශීය සභාව | 51 |
| 2. | මහරගම නගර සභාව | 66 |
| 3. | කැස්බෑව ප්‍රාදේශීය සභාව | 42 |
| 4. | කඩුවෙල ප්‍රාදේශීය සභාව | 46 |
| 5. | දෙහිවල-ගල්කිස්ස මහ නගර සභාව | 3 |
| 6. | මොරටුව මහ නගර සභාව | 59 |
| 7. | සීතාවකපුර නගර සභාව | 47 |
| 8. | සීතාවක ප්‍රාදේශීය සභාව | 201 |
| 9. | බොරලැස්ගමුව නගර සභාව | 9 |
| 10. | කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව | 16 |
| 11. | ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව | 13 |
| 12. | කොළොන්නාව නගර සභාව | 10 |
| 13. | කොළඹ මහ නගර සභාව | 101 |
| | **එකතුව** | 664 |

## කොළඹ දිස්ත්‍රික්කයෙන් පිටත - අවිච්ඡේද

■ මාතර, කුරුණෑගල, කළුතර, ගම්පහ, ගාල්ල, හම්බන්තොට, අම්පාර යන දිස්ත්‍රික්කයන්හි නිවාස 334 ක ඉදිකිරීම් කටයුතු නිම කිරීම. **(මුළු වියදම - රු. මි. 18.695)**

| | පළාත් පාලන බල ප්‍රදේශය | ඉදිකිරීම් නිම කල ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|
| 1. | ගම්පහ | 57 |
| 2. | කළුතර | 27 |
| 3. | අම්පාර | 09 |
| 4. | ගාල්ල | 05 |
| 5. | හම්බන්තොට | 137 |
| 6. | කුරුණෑගල | 64 |
| 7. | මාතර | 35 |
| | **එකතුව** | 334 |



## 2. පැල්පතින් තොර නගර වැඩසටහන - අවිච්ඡේද

නාගරික සහ අර්ධ නාගරික කලාපවල පැල්පත් සහ මුඩුක්කුවල ජීවත් වන ප්‍රජාව ඉලක්ක කරගෙන පැල්පතින් තොර නගර වැඩසටහන ක්‍රියාත්මක වු අතර පැල්පත් හා මුඩුක්කුවාසීන්ට ප්‍රමිතිගත නිවසක හිමිකාරිත්වය ලබාදීම මෙම වැඩසටහනේ අරමුණ විය.



මෙම වැඩසටහන පළාත් පාලන ආයතන වල සහයද ඇතිව ප්‍රජා සහභාගීත්වය මත සිදු කෙරුනු වැඩසටහනකි. මෙහිදී ඉදිකෙරුණු නිවාස සඳහා රු. 175,000.00 ක ප්‍රදානයක් වාරික වශයෙන් ප්‍රතිලාභියාට ලබාදුන් අතර ඉදිකිරීම් සඳහා ප්‍රජා ශ්‍රම දායකත්වය ලබා ගැනීම සිදුවිය.

ඒ අනුව 2009 වර්ෂයේ ක්‍රියාත්මක වු එම වැඩසටහන 2010 වර්ෂයේ ප්‍රතිපාදන නොලැබීම මත අතරමග නතරවුවද නැවතත් අවිච්ඡේද වැඩසටහනක් ලෙස 2010 වර්ෂයේ ඒ සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ලැබුණු මුදල් ප්‍රතිපාදනවලින් එම අවිච්ඡේද වැඩසටහන නිමකිරීමට කටයුතු කරන ලදී.

| දිස්ත්‍රික්කය | ව්‍යාපාතිය | නිවාස ගණන | මුදල (රු.මි) |
|---|---|---|---|
| කොළඹ | මොරටුව අයිවන්වත්ත | 30 | 3,880 |
| නුවරඑළිය | බඹරකැලේ | 27 | 2,796 |
| බදුල්ල | බදුලුපිටිය | 37 | 4,000 |
| | කයිලගොඩ | 15 | 1,575 |
| එකතුව | | 109 | 12,251 |

## 3. යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන - අවිච්ඡේද

නාගරික කලාප වල පිහිටි අඩු පහසුකම් නාගරික ජනාවාසවල අත්‍යාවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම මෙම වැඩසටහනේ අරමුණ විය.

මෙම වැඩසටහන යටතේ අඩු පහසුකම් නාගරික ජනාවාසවල ප්‍රජා සහභාගීත්වය මත යටිතල පහසුකම් සංවර්ධනය කරදීම සිදුවිය.

ඒ අනුව 2009 වර්ෂයේ ක්‍රියාත්මක වු එම වැඩසටහන 2010 වර්ෂයේ අතරමග නතරවුවද නැවතත් අවිච්ඡේද වැඩසටහනක් ලෙස 2010 වර්ෂයේ ඒ සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ලැබුණු මුදල් ප්‍රතිපාදනවලින් එම අවිච්ඡේද වැඩසටහන නිමකිරීමට කටයුතු කරන ලදී.

| දිස්ත්‍රික්කය | ව්‍යාපාතිය | විස්තරය | මුදල (රු මි) |
|---|---|---|---|
| නුවරඑළිය | බඹරකැලේ | සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම, පුතික ටැංකි ඉදිකිරීම, නල පද්ධති එළීම, ආධාරක බැම්ම ඉදිකිරීම | 2.5 |
| එකතුව | | | 2.5 |



## 4. නාගරික මහල් නිවාස වැඩසටහන

මහින්ද චින්තන ජාතික ප්‍රතිපත්තියට අනුව නාගරික ප්‍රදේශවල අඩු පහසුකම් සහිත ජනාවාස සංවර්ධනය කිරීම සඳහා මහල් නිවාස යෝජනා ක්‍රමයන් යෝජනා කර තිබේ

කොළඹ, ටොරින්ටන් මාවතේ 187 වත්තේ පදිංචි පවුල් 46 ක් පුනස්ථාපනය කිරීම සඳහා බොරැල්ල, බේස්ලයින් මාවත, සිංහපුර, 48 වත්ත මහල් නිවාස යෝජනා ක්‍රමය ආරම්භ කිරීමට අවශ්‍ය මූලික කටයුතු සැලසුම් කිරීම මෙම වසරේ සිදුකරන ලදී.

මොරටුව නාගරික කලාපයේ මුහුදු ඛාදනයට ලක්වන වෙරළ තීරයේ ජීවත්වන පැල්පත්වාසී ප්‍රජාව සඳහා මහල් නිවාස ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට මූලික කටයුතු සැලසුම් කිරීමද මෙම වසරේ සිදුවිය.

## 5. නගමු පුරවර වැඩසටහන

කොළඹ නගරයේ අඩු පහසුකම් සහිත ජනාවාසවල මූලික යටිතල පහසුකම් දියුණු කිරීමේ අරමුණින් මෙම වැඩසටහන ක්‍රියාත්මක විය.

ඒ අනුව මෙම වර්ෂය තුළ රු.මි. 0.999 ක මුදලක් පහත සඳහන් ව්‍යාපෘති වෙනුවෙන් වැයකර ඇත. ඒ අනුව,

1. බොරැල්ල, සහස්පුර මහල් නිවාස ක්‍රමයේ ආරක්ෂිත වැට ඉදිකිරීම.

2. බොරැල්ල, සිංහපුර නිවාස සංකීර්ණයේ ප්‍රධාන අප ජලය බැහැර කිරීමේ කාණු පද්ධතිය වැඩිදියුණු කිරීම.

3. ඔරුගොඩවත්ත, වදුළුසෙවණ නිවාස සංකීර්ණයේ අප ජලය හා වැසි ජලය බැහැර කිරීමේ කාණු පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම හා විදුලි මීටර පද්ධතිය ක්‍රමානුකූලව සකස් කිරීම.

## 2010 ලෝක ජනාවාස දින වැඩසටහන

2010 ලෝක ජනාවාස දිනය සැමරීම වෙනුවෙන් සංවිධානය කෙරුනු ''තුන්කල් දැක්ම'' ප්‍රදර්ශනයට සමගාමීව කොළඹ අඩු පහසුකම් නාගරික ජනාවාස 75 ක් ඉලක්ක කර ගනිමින් වයස් කාණ්ඩ තුනකට අනුව විවෘත චිත්‍ර තරගයක් සංවිධානය කල අතර, ඒ සඳහා ළමුන් 1300ක් පමණ සහභාගී විය.

ඊට අමතරව එම ජනාවාසවලම ජීවත්වන දරු දැරියන් සහ වැඩිහිටියන් ඉලක්ක කර ලෝක ජනාවාස දින තේමාව අරමුණු කර ගනිමින් කෙටි නාට්‍ය තරගයක් පැවැත්වීමට කටයුතු සැලසුම් කල අතර, ඒ සඳහා නාගරික ජනාවාස 25 කින් කෙටි නාට්‍ය 25 ක් ඉදිරිපත් විය.



## 07. මූල්‍ය ප්‍රකාශන

### නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය
### 2010/12/31 දිනට
### ශේෂ පත්‍රය

| 2009 | | සටහන් | 2010 වර්ෂය සඳහා | | |
|---|---|---|---|---|---|
| | <u>වත්කම්</u> | | | | |
| | <u>ජංගම නොවන වත්කම්</u> | | | | |
| 672,911.43 | ලී බඩු හා සවිකිරීම් | 1 | 1,142,639.18 | 330,546.19 | 812,092.99 |
| 588,762.17 | කාර්යාලීය උපකරණ | 2 | 1,053,666.50 | 328,986.53 | 724,679.97 |
| | | | 2,196,305.68 | 659,532.72 | 1,536,772.96 |
| | <u>ජංගම වත්කම්</u> | | | | |
| 500,000.00 | ඉදිකිරීම් සඳහා අත්තිකාරම් | | | | |
| 10,000.00 | අත්තිකාරම් | | | 50,000.00 | |
| 674,060.36 | මුදල් හා බැංකු ශේෂය | | | 29,266,556.80 | |
| | මුදල් හා බැංකු ශේෂය | | | 16,450.39 | |
| | මුදල් හා බැංකු ශේෂය | | | 3,139,000.00 | |
| | රිල් සමාගම | | | 7,597,195.67 | 40,069,202.86 |
| 2,445,733.96 | <u>මුළු වත්කම්</u> | | | | 41,605,975.82 |
| | <u>ස්කන්ධය,වගකීම් හා සංචිත</u> | | | | |
| **500,000,000.00** | අනුදත් ප්‍රාග්ධනය | | | | 5,000,000,000.00 |
| 3,388,468.92 | USIP වැඩසටහනින් පවරාගත් වත්කම් | | | 3,388,468.92 | |
| | <u>ජංගම නොවන වගකීම්</u> | | | | |
| (5,192,654.63) | අතිරික්ත/ඌණ ආදායම්/වියදම් | | | 25,848,324.50 | 29,236,793.42 |
| (1,804,185.71) | | | | | |
| | <u>ජංගම වගකීම්</u> | | | | |
| | රඳවාගත් මුදල් | | | 191,722.40 | |
| 3,437,919.67 | උපචිත වියදම් | 3 | | 11,794,460.00 | |
| 812,000.00 | පාරිතෝෂික ගෙවන්කිරීම් | 4 | | 383,000.00 | 12369182.40 |
| 2,445,733.96 | <u>මුළු වගකීම්</u> | | | | 41,605,975.82 |

අවසන් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලයේ වගකීම වේ.

| | | |
|---|---|---|
| අධ්‍යක්ෂ (මුදල්) | අධ්‍යක්ෂ ජනරාල් | සභාපති |
| නා.ජ.සං.අ | නා.ජ.සං.අ | නා.ජ.සං.අ |

මූල්‍ය ප්‍රකාශන



## නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

## 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් හා වියදම් ගිණුම

| 2009 | ආදායම් හා වියදම් ගිණුම් ශේෂය 2009/12/31 | | (5,192,654.63) |
|---|---|---|---|
| | **ආදායම්** | | |
| | අමාත්‍යාංශය | 117,219,000.00 | |
| | ජාතික නිවාස සංවර්ධන අධිකාරිය | 1,000,000.00 | |
| | එ. ජා. මානව ජනාවාස වැඩසටහන | 1,795,200.00 | |
| 148,545,294.29 | ආදායම්(නා.සං.අ අරමුදල) | 31,418,161.48 | 151,432,361.48 |
| 148,545,294.29 | | | 146,239,706.85 |
| | **වියදම්** | | |
| 134,596,347.10 | සංවර්ධන වියදම් | 89,684,680.06 | |
| | නගමු පුරවර | 999,880.00 | |
| 277,117.35 | වෙනත් සංවර්ධන වියදම් | | 90,684,560.06 |
| 13,671,829.86 | | | 55,555,146.79 |
| | **පරිපාලන පොදු කාර්ය වියදම්** | | |
| 7,315,622.86 | වැටුප් | 17,144,285.62 | |
| | ආරක්ෂක වියදම් | 450,485.44 | |
| | අධ්‍යක්ෂක මණ්ඩල දීමනා | 214,220.00 | |
| 47,675.00 | වේතන | 45,500.00 | |
| 228,211.40 | අතිකාල දීමනා | 291,979.21 | |
| 57,430.00 | වෙනත් දීමනා | 130,024.90 | |
| 240,712.75 | ගමන් වියදම් | 73,787.20 | |
| 938,417.11 | සේ.අ.සා අරමුදල | 3,291,260.60 | |
| 133,366.41 | සේ.භා.අරමුදල | 398,088.95 | |
| 32,905.12 | සුභසාධන වියදම් | 167,426.16 | |
| 422,303.60 | ලිපි ද්‍රව්‍ය | 236,806.39 | |
| 297,745.50 | ඉන්ධන | 543,749.90 | |
| 9,560.00 | පුවත්පත් | 7,940.00 | |
| 36,645.00 | මුද්දර | 30,808.00 | |
| 279,011.11 | දුරකථන වියදම් | 323,747.26 | |
| 1,482,789.80 | කාර්යාල කුලී වියදම් | 4,389,467.69 | |
| | ජල බිල්පත් | 19,871.26 | |
| 621,914.79 | මුද්‍රණ වියදම් | 506,743.82 | |
| 1,044,874.00 | ප්‍රචාරණ | 79,150.00 | |
| 2,679,663.51 | ප්‍රවාහන වියදම් | 2,457,510.55 | |
| 60,841.56 | විදුලිය | 66,109.60 | 30,868,962.55 |
| (2,257,859.66) | | | 24,686,184.24 |
| | **වෙනත් මෙහෙයුම් වියදම්** | | |
| 1,000,808.50 | උත්සව වියදම් | 789,253.00 | |
| 175,899.38 | අනෙකුත් වියදම් | 126,189.00 | |
| 25,778.50 | සංග්‍රහ කටයුතු | | |
| 401,091.24 | පුහුණු වැඩසටහන් සඳහා වියදම් | 356,954.35 | |
| 21,388.00 | පරිභෝජන අයිතම මිලදී ගැනීම | 16,856.40 | |
| 101,850.00 | ප්‍රදර්ශන වියදම් | 1,450,200.00 | 2,739,452.75 |
| (3,984,675.28) | | | 21,946,731.49 |
| | **වෙනත් වියදම්** | | |
| | අළුත්වැඩියා හා නඩත්තු වියදම් කාර්යාල | | |
| 98,368.91 | උපකරණ | 281,579.08 | |
| 77,338.76 | පිරිසිදු කිරීමේ වියදම් | 142,313.68 | 423,892.76 |
| (4,160,382.95) | | | 21,522,838.73 |
| | **වෙන්කිරීම්** | | |
| 102,018.35 | ලී බඩු හා සවිකිරීම් සඳහා ක්ෂය වෙන්කිරීම් | 228,527.84 | |
| 118,253.33 | කාර්යාලීය උපකරණ සඳහා ක්ෂය වෙන් කිරීම් වෙන්කිරීම් | 210,733.20 | |
| 812,000.00 | පාරිතෝෂික වෙන්කිරීම් | | 439,261.04 |
| **(5,192,654.63)** | ඌණ ආදායම්/වියදම්/අතිරික්තය | | **21,083,577.69** |





## නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය
### 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
### මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | | |
|---|---|---|
| වර්ෂයතුල ජනිතවූ මුදල් ප්‍රවාහය | | 151,432,361.48 |
| | | |
| <u>මෙහෙයුම් කටයුතු සඳහා</u> | | |
| පරිපාලන වියදම් | 30,551,277.40 | |
| වෙනත් මෙහෙයුම් කටයුතු | 2,739,452.75 | |
| වෙනත් සංවර්ධන කටයුතු | 423,892.76 | |
| අත්තිකාරම් | 50,000.00 | (33,764,622.91) |
| | | |
| <u>ආයෝජන කටයුතු සඳහා</u> | | |
| සංවර්ධන වියදම් | 77,588,748.31 | |
| ස්ථාවර වත්කම් | 733,847.40 | |
| රිල් සමාගම | 7,597,195.67 | (85,919,791.38) |
| | | 31,747,947.19 |
| | | |
| 2010.01.01. දිනට මුදල් හා බැංකු ශේෂය | | 674,060.00 |
| | | |
| 2010.12.31. දිනට මුදල් හා බැංකු ශේෂය | | **32,422,007.19** |

**මෙම මුදල් ප්‍රවාහ ප්‍රකාශය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 09 අනුව සෘජු ක්‍රමයට පිළියෙල කර ඇත.**

මුදල් පනත 14/(2)C වගන්තිය ප්‍රකාර
විගණකාධිපති වාර්තාව



# විගණකාධිපති දෙපාර්තමේන්තුව
## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
## AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல / My No } විවව/බී/පුරසංවිත/වාර්/01/2010

ඔබේ අංකය / உமது இல / Your No. }

දිනය / திகதி / Date } 2011 ජූනි 24 දින

සභාපති
නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

එච්.ඒ.එස්.සමරවීර
වැඩබලන විගණකාධිපති

පිටපත් : 01. ලේකම් - ඉදිකිරීම් , ඉංජිනේරු සේවා නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය

02. ලේකම් - මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය


නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07, ශ්‍රී ලංකාව

சுதந்திர சதுக்கம்,
கொழும்பு 07, இலங்கை

INDEPENDENCE SQUARE,
COLOMBO 07, SRI LANKA

දුරකථනය / தொலைபேசி / Telephone. } 2691151

ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. } 2697451

ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. } oaggov@sltnet.lk




# විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No : විවටි/බී/පුජසංඅ/වංජ/01/2010 | ඔබේ අංකය / உமது இல / Your No. : | දිනය / திகதி / Date : 2011 ජුනි 24 දින |

සභාපති

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

---

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාර පනතේ 17 (2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කල යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ඉදිරියේදී නිකුත් කරනු ඇත.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් ; යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත් , අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුලත් වේ.


නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07, ශ්‍රී ලංකාව

சுதந்திர சதுக்கம்,
கொழும்பு 07, இலங்கை

INDEPENDENCE SQUARE,
COLOMBO 07, SRI LANKA

දුරකථනය / தொலைபேசி / Telephone. : 2691151
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. : 2697451
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. : oaggov@sltnet.lk



## 1.3 විගණන විෂය පථය

-----------------------

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුලත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මකව සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 මතය

----------

මාගේ පරීක්ෂණයෙන් පෙනියන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර , 2010 දෙසැම්බර් 31 දිනට නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.



2.1.1 අධිකාරියේ ආරම්භක ප්‍රාග්ධනය

2008 අංක 36 දරණ නාගරික ජනාවාස සංවර්ධන අධිකාරී පනතේ 16(3) අනුව අධිකාරියේ ආරම්භක ප්‍රාග්ධනය රුපියල් මිලියන 5000 ක් විය යුතු අතර එය කොටස් වශයෙන් රජයේ ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබිය යුතු වුවද 2010 වර්ෂය නිම වන විටත් එලෙස ප්‍රාග්ධනය ගොඩනගා නොතිබුණි.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

2.2.1 ආයතනයේ අඛණ්ඩ පැවැත්ම

2008 අංක 36 දරණ නාගරික ජනාවාස සංවර්ධන අධිකාරී පනතේ 16(ඉ) උප වගන්තිය අනුව අඩු වියදම් නිවාස වැඩසටහන් වලට මුදල් සැපයීම සඳහා දේපල සංවර්ධනය කරන්නන්ගෙන් සේවා ගාස්තු වශයෙන් නාගරික සංවර්ධන අධිකාරිය විසින් එකතු කර ගනු ලබන සියළු මුදල් අධිකාරියේ අරමුදලට බැර කළ යුතු වුවද 2010 මාර්තු මාසයෙන් පසුව අධිකාරියට එලෙස මුදල් ලැබී නොතිබුණි. තවද 2010 දෙසැම්බර් 14 දිනැති අංක 10/2951/504/012 දරන කැබිනට් තීරණය අනුව නාගරික සංවර්ධන අධිකාරිය විසින් මෙම සේවා ගාස්තු අයකිරීම නවතා ඇති අතර ඒ හේතුවෙන් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ ප්‍රධාන ආදායම් මාර්ගය අහිමි වී තිබූ අතර මේ හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම භාණ්ඩාගාරයේ මූල්‍ය සහනය මත රඳා පවතී.

2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 03
පහත පරිදි ප්‍රමිතියට පටහැනිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි.

I ලැබිය යුතු සේවා ගාස්තු ආදායමට එරෙහිව ගෙවිය යුතු ගොඩනැගිලි කුලිය හිලවු කිරීම

II මූල්‍ය ප්‍රකාශන වල කොටසක් ලෙස ඉදිරිපත් කළ යුතු ස්කන්ධ ප්‍රාග්ධනයේ වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය ඉදිරිපත් නොකිරීම.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 09
මුදල් ප්‍රවාහ ප්‍රකාශය ප්‍රමිතියේ නියමයන්ට අනුකූලව පිළියෙල කර නොතිබුණි.



(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16
පාර්තෝෂික අරමුදලක් ගොඩනගා අදාල මුදල් ආයෝජනය කර නොතිබුණි.

2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) 187 වත්ත නැමති නිවාස ව්‍යාපෘතිය ඉදිකිරීම ප්‍රමාදවීම් හේතුවෙන් අදාල නිවාසලාභීන් වෙත ගෙවිය යුතු අමතර මුදල වූ රු.1,564,000 සඳහා මූල්‍ය ප්‍රකාශන වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) ස්ථාවර වත්කම් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවිය යුතු මුදල රු.200,785 ක් වුවද එය රු.257,100 ක් ලෙස රු.56,315 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. එහෙයින් වර්ෂයේ ක්ෂය වීම්ද රු.11263 ක් වැඩියෙන් ගිණුම් ගත කර තිබුණි.

(ඇ) 2007 පෙබරවාරි 22 දින අංක අමප/07/0140/226/013 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව නාගරික ජනාවාස අධිකාරිය පිහිටවූ වහාම රිල් ආයතනය ඈවර කර එහි කාර්ය මණ්ඩලය හා වත්කම් අධිකාරියට පවරා ගත යුතු වුවද, ඒ සඳහා සමාලෝචිත වර්ෂය අවසානය තෙක් අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. කෙසේ වෙතත් ආයතනය ඈවර කර එහි කාර්ය මණ්ඩලය හා වත්කම් අධිකාරියට පවරා ගැනීම ප්‍රමාද වීමට නෛතික කටයුතු ප්‍රමාදවීම හා සමාගම සතුව විශාල බැරකම් ප්‍රමාණයක් තිබීම ආදී කරුණු ඉවහල් වී ඇති බව සභාපතිවරයා විසින් පවසා ඇත.

2.2.4 නීති රීති රෙගුලාසි ආදියට අනුකූල නොවීම.

-----------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම. |
|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 14(1) වගන්තිය සහ PF/PE 21දරන 2002 මැයි 24 රාජ්‍ය මුදල් චක්‍රලේඛය | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ සමාලෝචිත වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |



(ආ) මුදල් රෙගුලාසි (මු.රෙ)

-------------------------

| | |
|---|---|
| මු.රෙ.133 | අධිකාරිය විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි. |

3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

-------------------------------------

3.1 මූල්‍ය සමාලෝචනය

---------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය තුළදී අධිකාරියේ මෙහෙයුම් වලින් වූ ප්‍රතිඵලය රුපියල් 21,083,578 ක අතිරික්තයක් වූ අතර පෙර වර්ෂයේ ඌනතාවය සදොස් ලෙස ආදායමට එරෙහිව ගැලපීම ඉවත්කල විට එය රුපියල් 26,276,233 ක අතිරික්තයකි. පෙර වර්ෂයේ රුපියල් 5,192,655 ක් වූ ඌනතාවයට සාපේක්ෂව රුපියල් 31,468,888 ක වර්ධනයකි. කෙසේ වෙතත් වර්ෂය අගභාගයේදී සංවර්ධන කටයුතු සඳහා ලද මුදල් වියදම් කර නොතිබීම හේතුවෙන් මෙවැනි යහපත් තත්ත්වයක් නිරූපනය වන බවද නිරීක්ෂණය කෙරේ.

3.2 මෙහෙයුම් සමාලෝචනය

--------------------------

3.2.1 කාර්ය සාධනය

--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2010 වර්ෂය සඳහා වූ අධිකාරියේ ක්‍රියාකාර සැලැස්මේ ඇතුලත් පහත විස්තර දැක්වෙන කිසිදු ව්‍යාපෘතියක් ආරම්භ කර නොතිබුණු බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත් නාගරික සංවර්ධන අධිකාරියෙන් ලැබිය යුතු 1% සේවා ගාස්තු නොලැබීම නිසා මෙම තත්ත්වය ඇතිවූ බව සභාපතිවරයා විසින් දක්වා තිබුණි..



| ව්‍යාපෘතිය | 2010 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට යෝජිත ඒකක සංඛ්‍යාව | වටිනාකම (රු. මිලියන) |
|---|---|---|
| විසිරි නිවාස | 2750 | 340.0 |
| විසිරි නිවාස (පුනරාවර්තන) | 1549 | 111.1 |
| පැල්පතින් තොර නගර වැඩ සටහන - නව | 200 | 20.3 |
| පේලි නිවාස (පුනරාවර්තන ) | 133 | 9.0 |
| 187 වත්ත මහල් නිවාස | 56 | 167.1 |
| කොළඹ නගරයේ මහල් නිවාස 40,000 වැඩ සටහන | 40,000 | 1200.0 |
| එකතුව | | 1847.5 |

(ආ) මේ අනුව අධිකාරිය විසින් මූල්‍ය ප්‍රතිපාදන ලබාගැනීමේ හැකියාව පිළිබඳව ඇගයීමක් නොකර අතාත්වික ලෙස ක්‍රියාකාර සැලැස්ම සකස්කර ඇති බව නිරීක්ෂණය විය.

(ඇ) තවද මූල්‍ය ප්‍රකාශන වල සංවර්ධන වැය ලෙස දක්වා ඇති රු.85,219,680 මුදල කිසිදු නව ව්‍යාපෘතියකට අදාලව දරන ලද්දක් නොවන බවත්, ඉකුත් වර්ෂයේ අවිච්ඡේද වැඩ වෙනුවෙන් දරන ලද වියදම් බවත් නිරීක්ෂණය විය.

### 3.2.2 සංයුක්ත සැලැස්ම

2003 ජුනි 02 දිනැති අංක PED / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1 වගන්තිය පරිදි අධිකාරිය සඳහා 2010 වර්ෂය ආවරණය වන පරිදි සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 3.2.3 විගණන හා කළමණාකරන කමිටුව

2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4 වගන්තිය පරිදි 2010 වසර සඳහා විගණන හා කළමණාකරන කමිටුව පිහිටුවා නොතිබුණි.



3.2.4 අනාර්ථික ගණුදෙනු

---

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) 187 වත්ත පුනස්ථාපන ව්‍යාපෘතිය

---

(I) නාගරික සංවර්ධන අධිකාරිය සතු පර්චස් 52 ක් වූ ඉඩමක් පවරා ගැනීම සම්බන්ධයෙන් කිසිදු ලිඛිත ගිවිසුමක් නොමැතිව එම ඉඩමේ නිවාස යෝජනා ක්‍රමයක් ඉදිකිරීමට සැලසුම් කර හඳුනාගත් පවුල් 46 ක් සමඟ අවබෝධතා ගිවිසුමක් ද අත්සන් කර ඒ අනුව රුපියල් ලක්ෂ 46 ක් පදිංචිකරුවන් 46 දෙනෙකුට ගෙවා තිබුණි.

(II) 2009 දෙසැම්බර් 02 වන දින නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය සහ අදාළ නිවාස හිමියන් අතර අත්සන් කර ඇති අවබෝධතා ගිවිසුමෙහි 7(iii) වගන්තිය අනුව ඉහත කී ව්‍යාපෘතිය අවසන් කිරීමට අවශ්‍ය කාලය ගිවිසුමේ ආරම්භක දින සිට මාස 12 ක් ඉක්ම වේ නම් එසේ ඉකුත් වන සෑම මාස තුනකට හෝ අඩුකාලයක් සඳහා දෙවන පාර්ශවකරු වෙත මෙම ගිවිසුමේ ආරම්භක දින සිට මාස 10 ක් ඇතුළත රුපියල් 33,500 ක මුදලක් එකවර ගෙවීම පලමු පාර්ශවය වන අධිකාරිය විසින් සිදුකළ යුතුය. මේ වන විට අවබෝධතා ගිවිසුම අත්සන් කර වර්ෂයක කාලයක් ඉක්මවා ඇතත් කිසිදු සංවර්ධන කාර්යයක් ආරම්භකර නොමැති තත්වයක් තුළ ගිවිසුම අනුව දෙවන පාර්ශවය විසින් ගෙවල් කුලී ඉල්ලා සිටීමට හෝ අධිකාරියට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට හැකි තත්වයක් නිර්මාණය වී ඇති බව නිරීක්ෂණය විය.

3.2.5 කළමණාකරණ අකාර්යක්ෂමතා

---

විධිමත් සැලසුමකින් තොරව අධිකාරිය විසින් 187 වත්ත නැමති නිවාස ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට පියවර ගෙන තිබුණද ඉදිකිරීම් සඳහා ගත යුතු කිසිදු පියවරක් ගැනීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි. එමෙන්ම අධිකාරිය විසින් දෙවන පාර්ශවයන් සමග ගිවිසුම්ගත බැඳීම් ඇතිකර ගෙන තිබීම හේතුවෙන් අනාගතයේදී මූල්‍යමය අර්බුද වලට මුහුණ දීමේ අවධානමක් ද නිරීක්ෂණය විය. රාජ්‍ය දේපල කළමනාකරණය කිරීමේදී අධිකාරිය නිසි දැනුවත් වීමකින් කාර්යක්ෂමතාවයකින් හා ඵලදායිතාවයකින් තොරව කටයුතු කර ඇති බව නිරීක්ෂණය විය.



3.2.6 මානව සම්පත් කළමණාකරන

---------------------------------

අධිකාරිය පිහිටුවා වර්ෂ 02ක් පමණ ගත වුවද අධිකාරියේ සභාපති හා අධ්‍යක්ෂ ජනරාල් තනතුරු හැර සෙසු කාර්ය මණ්ඩලයේ 73 දෙනාම කොන්ත්‍රාත් පදනම මත සේවයේ නිරත කර ඇති බව නිරීක්ෂණය විය. මේ වන විට සේවක මණ්ඩලය සඳහා අදාල අනුමැතීන් ලද බවත්, බඳවා ගැනීම් කටයුතු කඩිනමින් ඉටුකරන බවත් සභාපතිවරයා විසින් දක්වා තිබුණි.

3.2.7 අවිධිමත් ගණුදෙනු

------------------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) අධිකාරිය විසින් වර්ෂය තුල මෝටර් රථ කුලී පදනම මත ලබාගැනීම වෙනුවෙන් රු.2,457,511 ක් වැයකර ඇති අතර එහිදී 2002 ඔක්තෝබර් 11 දිනැති ප්‍රතිපත්ති සම්පාදන හා ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය මගින් නිකුත්කර ඇති අංක MPDI/MPRD/VEH දරණ චක්‍රලේඛයේ විධිවිධාන අනුගමනය කර නොතිබුණි.

(ආ) රිල් ආයතනයට අයත් නිවාස යෝජනා ක්‍රම අලුත්වැඩියා සඳහා සහ රීල් ආයතනයේ සේවක වැටුප් ගෙවීම සඳහා අධිකාරිය විසින් දරන ලද රු.7,597,196 ක් රැංගම වත්කමක් ලෙස ගිණුම් ගතකර තිබුණි. කෙසේ වෙතත් මෙම කටයුත්ත සඳහා ඉදිකිරීම් ඉංජිනේරු සේවා නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයෙන් ලද මූල්‍ය ප්‍රතිපාදන ගැලපීමක් සිදුකර නොතිබුණි.

4. පද්ධත හා පාලන

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර අධිකාරියේ සභාපතිවරයා දැනුවත් කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකල යුතු වේ.

(අ) ප්‍රාග්ධනය යොදවීම
(ආ) ගිණුම්කරණය
(ඇ) සංවර්ධන වියදම් කළමනාකරණය
(ඈ) මානව සම්පත් කළමනාකරණය

එච්.ඒ.එස්.සමරවීර
වැඩ බලන විගණකාධිපති